**ජාතික තරුණ සේවා සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම් ලාභ හෝ අලාභ වල ඇතුළත් කල යුතු වුවද, පෙර වර්ෂයට අදාල එකතුව රු. 6,173,432 ක් වූ ආරක්ෂක හා දුරකථන වියදම් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල මෙම වියදම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුල හදුනාගත් සියළුම ආදයම් හා වියදම් අයිතම් ලාභ හෝ අලාභ වල ඇතුලත් කලයුතු වුවද මගහැරී තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වර්ෂයට අදාල වියදම් ඇතුළත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩයකට අයත් සියළුම දේපල ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, 2021 වර්ෂයේදී මධ්‍යස්ථාන පහකට අයත් ගොඩනැගිලි පමණක් රු. 46,546,500 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි. | රජයේ තක්සේරු වාර්ථා ලැබීමෙන් පසුව අනෙකුත් ගොඩනැගිලි ප්‍රත්‍යාගනනය කර ගිණුම් ගතකිරීමට කටයුතු සිදුකරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු. 1,780,839,673 ක් වූ වත්කම් වර්ග 11 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි .එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | තවදුරටත් ප්‍රයෝජනයට ගනුලබන ජංගම නොවන වත්කම් රජයේ පිළිගත් තක්සේරුකරුවන්ලවා විධිමත් පරිදි තක්සේරුකර ප්‍රත්‍යාගනනය සිදුකොට අදාල ගිණුම්ගතකිරීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළි දරව් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ අක්කර 03 පර්චස් 92 ක ප්‍රමාණයක් වූ ඉඩම් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් සම්බන්ධයෙන් රජයේ තක්සේරු වාර්ථා ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති අතර රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවේ අදාල තක්සේරු වාර්ථා ලැබීමෙන් පසු අදාල වටිනාකම් ගිණුම් ගතකරන බවට දන්වා සිටිමි. | සභාවට නීත්‍යානුකූල අයිතිය හිමි වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2019 වර්ෂයේ සුගතදාස ක්‍රීඩාංගණය වෙත යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් ලබාදී තිබූ රු. 2,293,733 ක මුදල 2021 වර්ෂයේදී පවත්වනු ලැබූ යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරා තිබුණද එම මුදල 2021 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකර 2019 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 2020 වර්ෂයේදී රටේ පැවැති කොවිඩ් 19 තත්වය මත ජාතික ක්‍රීඩා උත්සවය පැවැත්වීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මෙම ක්‍රීඩා උත්සවය පැවැත්වුණු අතර, එම වියදම 2019 වර්ෂයේ ගෙවූ මුදලට හිලව් කිරීම මත වැරදි ආකාරයට 2019 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත.ඉදිරි වර්ෂයේදී මෙවැනි මූලික ගිණුම්කරණ දෝෂ ඇති නොවීමට වගබලාගන්නා අතර අදාල නිලධාරීන් විෂයානුබද්ධව දැනුවත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වර්ෂයට අදාල සියළු වියදම් ඇතුළත් කළ යුතුය. |
| (ඇ) 2020 සහ 2021 වර්ෂවලදී ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබුණු රු. 5,196,942 ක් වූ ප්‍රාග්ධන වියදම වර්ෂයේ අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ශුද්ධ ඌණතාවය වැඩියෙන්ද ස්ථාවර වත්කම් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ද රු. 312,138 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණන පරික්ෂාවේ පෙන්වා ඇති පරිදි අදාල නිවැරදි කිරීම් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේදී සිදුකර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රු. | රු. | රු. | | |
| 164,162 | 104,300,311 | 104,136,149 | 2022 වර්ෂයේ මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර ඇති අතර 2022 වර්ෂයේ සිට විධිමත් මූල්‍ය පාලනයක් යටතේ අදාල වියදම් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම්ගත කෙරෙන බව දන්වා සිටිමි. | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ණය ශේෂ සමාගමේ තොරතුරු සමග පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර , සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාගමේ ගිණුම් වර්ෂය අප්‍රේල් 01 දින සිට මාර්තු 31 නමුත් ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය වර්ෂයන් ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින බැවින් සමාගමේ මූල්‍ය වර්ෂය සංශෝධනය කිරීමට සමාගම් පනතේ ප්‍රතිපාදන යටතේ ඇති හැකියාව ඉදිරියේදී විමසා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් ඒ පිළිබඳව ඔබව දැනුවත් කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන දිනට සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මූල්‍ය තොරතුරු සමග ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක PS/SP/SB/21/2018 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය. | සභාව සතුව නේවාසික පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පහසුකම් තිබියදී 2021 පෙබරවාරි සහ මාර්තු මාසවල බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි පෞද්ගලික ආයතනයක පුහුණු වැඩසටහන් 03 ක් පවත්වා ඒ සඳහා රියදුරන් ඇතුළුව නිලධාරීන් 194 ක් වෙනුවෙන් ආහාර හා නේවාසික පහසුකම් වෙනුවෙන් රු. 3,246,600 ක් වියදම් දරා තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිලධාරින් තම රාජකාරි සමබරව පවත්වා ගනිමින් 2021 වසර සමාජය මුහුණ දෙන අභියෝග වලට අවශ්‍ය පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් ත්‍රාසජනක ක්‍රීඩා (Adventure Sports) හා බුද්ධි කලම්බන ක්‍රියාකාරකම් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද වලට අනුකූලව, ආයතනයේ විශේෂ උපදේශකවරුන් මඟින් ක්‍රියාත්මක කර පුහුණු වැඩමුළු සාර්ථක කර ගැනීමට මෙම ආයතනය තෝරාගෙන වැඩමුළු පවත්වා ඇති බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | අවම පිරිවැයක් යටතේ ඉහළ ප්‍රතිලාභ ලබාකර ගත හැකි වන පරිදි උත්සව සංවිධානය කර ක්‍රියාත්මක කළ යුතු වුවත්, එරමිණියාය ගොවිපල පුහුණු මධ්‍යස්ථානයේ 2020 වර්ෂයේ වප්මගුල් හා රන් අස්වනු නෙලීමේ උත්සවය වෙනුවෙන් එකතුව රු. 399,176 ක් දරා තිබූ අතර මෙම වියදම තුළ සංග්‍රහ වියදම් හා සභාපති ඇතුළු නිලධාරියකුගේ නවාතැන් පහසුකම් ලෙස රු. 290,250 ක හොටෙල් ගාස්තු ඇතුළත් වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි ආකාරයේ වැය දැරීම් සිදු නොකරන ලෙසත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී රජය හා ආයතනිකව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට සියළු වගකිව යුතු නිලධාරින් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 249,189,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.198,007,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 51,182,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට තරුණ සංවර්ධන වියදම් රු .91,951,000 කින් වැඩි වීම හා ආයතන හා පරිපාලන වියදම් රු. 16,362,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ශ්‍රී ලංකා යූත් ස්ටාර්ට් අප් චැලේන්ජ් වැඩසටහන යටතේ උප වැඩසටහන් 4 ක් සඳහා 2021 දෙසැම්බර් 20 දින වන විට රු. 1,402,810 ක් වැයකර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම මත එම මුදල නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි. | ස්ටාර්ට් අප් චැලේන්ජ් වැඩසටහනේ මූලික අරමුණ ලෙස තරුණ ව්‍යවසායකයින් බිහි කිරීම හා ව්‍යවසායකයින් එලි දැක්වීම තුලින් අනෙකුත් තරුණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම අරමුණ කරගනිමින් ජාත්‍යන්තරය ජයගත් ව්‍යාපාරකයින් කිහිප දෙනෙකු සම්බන්ධ කර ගනිමින් Full HD තාක්ෂණය යටතේ මෙම විඩියෝ පටය සකස් කිරීම සඳහා ලෙෆ්ට් හැන්ඩ් ස්ටූඩියෝ ආයතනය වෙත භාර දෙන ලදී. ඒ අනුව රු.300,000 ක අත්තිකාරම් මුදලක් අදාල ආයතනය වෙත ගෙවීම් කර ඇත. | ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා සහභාගී වන නිලධාරීන්ට බෙදාහැරීම සඳහා ටී ෂර්ට් සහ කලිසම් එකතුව 7000 ක ප්‍රමාණයක් රු. 4,706,100 ක් වැය කර 2021 අප්‍රේල් 30 දින මිලදී ගෙන තිබුණ ද ඉන් 2021 ඔක්තෝබර් 15 දින වන විටත් ගබඩාවේ 5453 ක තොගයක් පැවතුණි. එසේ තිබියදී සුහුරු ගෙවත්ත වැඩසටහන සඳහා 2021 අගෝස්තු 13 හා සැප්තැම්බර් 28 යන දිනයන්හි රු. 643,500 ක් වැයකර ටී ෂර්ට් 900 ක් මිලදී ගෙන තිබුණි. | ගබඩාව සතුව පැවති ටී ෂර්ට් වෙනත් වැඩසටහනක් සඳහා මුද්‍රණය කරන ලද ඒවා වූ අතර එම ටී ෂර්ට් මෙම වැඩසටහන ප්‍රවර්ධන කිරීම සඳහා යොදා ගත නොහැකි වූ බැවින් ඉහත ටී ෂර්ට් " සුහුරු ගෙවත්ත" යන නම යටතේ මුද්‍රණය කරන ලදී. | රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවදානය යොමු කළ යුතුය. |
| (ඇ) | කෝවිඩ් රෝගී සත්කාරක සේවාවන්ට සහය දැක්වීමේ අරමුණින් ගිලන් රථ නවීකරණය කර රෝහල්වලට සැපයීමේ වැඩසටහන යටතේ 2021 ජුනි 06 හා 19 දිනයන්හි එරම්ණියාය ගොවිපලට රැගෙනවිත් තිබුණු ගිලන් රථ 02 අදාල අලුත්වැඩියාවෙන් තොරව 2021 ජුනි 21 හා 25 දී ගොවිපල පරිශ්‍රයෙන් නැවත රැගෙන ගොස් තිබුණි. ඒ අනුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල සමාරම්භක උත්සවය වෙනුවෙන් දැරූ රු. 149,365 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය. | එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් කාර්මික පාඨමාලාව හදාරනු ලබන අභ්‍යාසලාභීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අපේක්ෂාව ඇතිව අබලන් වූ ගිලන් රථ නවීකරණය කිරීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කලද කෝවිඩ් වසංගත තත්ත්වය හේතු කොට ගෙන අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. | රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නීරෝගීමත් ක්‍රියාශීලී ජීවන රටාවකට තරුණ පරපුර හුරු කිරීම උදෙසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා යෞවන සමාජ මට්ටමින් කායවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩසටහන යටතේ එරම්ණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථාන භූමියේ කාය වර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හා උපකරණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු. 1,095,258 ක් වැයකර තිබුණද එම මධ්‍යස්ථානය භාවිතා නොකිරීම හේතුවෙන් සම්පූර්ණ වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | කාය වර්ධන මධ්‍යස්ථානය යෞවන සමාජ ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් හා මධ්‍යස්ථානයේ අභ්‍යාසලාභීන් වෙත පරිහරණය කිරීම සඳහා ස්ථාපිත කරන ලද්දකි. රට තුල පැවති අයහපත් සෞඛ්‍ය වාතාවරණය හේතුවෙන් පරිහරණය කිරීම තාවකාලිකව සීමා වුවද ඉදිරියේදී විවෘත කිරීම සඳහා කටයුතු සකස් කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ අරමුණුවලට පරිබාහිර කාර්යයක් ලෙස ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා රු. 11,519,609 ක් වැය කර තිබුණි. මේ සඳහා සභාවේ ගොඩනැගිලි හා උපකරණ භාවිත කිරීමකින් තොරව දිනකට රු. 83,525 ක් බැගින් දින 24 ක් සඳහා රු. 2,004,600 ක් ගෙවා ඩෝම්ස් 01 ක් ආයතන භූමිය තුළ සකස් කිරීම මත එම වියදම නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය. | ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ නේවාසිකව තරුණ තරුණියන් සිටි බැවින් බාහිර පුද්ගලයින් ආයතන පරිශ්‍රයට ඒම වැලැක්වීම සඳහා හා රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ඩෝම් එකක් කුලී පදනම මත ලබා ගන්නා ලදී. | වැඩසටහන් පැවැත්වීමේදී රාජ්‍ය අරමුදල් අවම වශයෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එරම්ණියාය ගොවිපල පුහුණු මධ්‍යස්ථානය තුළ නිසි සැලසුමකින් හා අධීක්ෂණයකින් තොරව ක්‍රියාත්මක කරන ලද කෘෂි බෝග සිටුවීමේ ව්‍යාපෘති 06 කට අදාලව 2021 ඔක්තෝබර් 06 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවට අනුව ගොවිපල නිලධාරීන්ගේ අධීක්ෂණය දුර්වල වීම හා නඩත්තු සිදු නොකිරීම හේතුවෙන් එකතුව රු. 449,133 ක පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | වැඩසටහන් සැලසුම් කිරීමේදී පිරිවැය අවම වන ආකාරයෙන් කටයුතු කරන ලෙසට අදාල වගකිව යුතු නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කිසිදු ශාස්තුවක් අයකර ගැනීමකින් තොරව තරුණ සේවා සමාගමට සභාවේ ගොඩනැගිලි භාවිතා කිරීමට ඉඩ පහසුකම් ලබාදී තිබියදීත් ගබඩාවක් සහ රියදුරු 50 කට පමණ නේවාසික පහසුකම් සැපයීමට ඉදිකර තිබුණු පිරිවැය රු. 107,526,046 ක් වූ නව ගොඩනැගිල්ලේ දෙවන මහල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව සහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් 2021 ජුනි 10 දින ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ලබාදී තිබුණි. කෙසේ නමුදු 2016 වසරේ සිට වසර පහකට ආසන්න කාලයක් සභාවේ ප්‍රධාන ගබඩාව තාවකාලිකව ස්ථාන 03 ක අනාරක්ෂිතව පැවතුණි. | රියදුරු නේවාසිකාගාරය ස්ථාපිත කිරීම සඳහා මේ වන විට කටයුතු කර ඇති අතර ගබඩාව ස්ථාපිත කිරීමට පෙර ඊට අදාලව නිම කල යුතු යටිතල පහසුකම් නිම කල යුතු බැවින් එම කාර්යයන් අවසන් වීමෙන් පසුව ගබඩා පරිහරණය සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) ආදායම් එකතු කර ගැනීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ජාතික තරුණ සේවා සභාවට අයත් එරම්ණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථානයේ සහල් තොග පෞද්ගලික පරිහරණයට ගැනීම, අස්ථානගතවීම හා නාස්ති වීම යනාදී හේතු නිසා වටිනාකම රු. 1,133,142 ක් වූ සහල් කිලෝ ග්‍රෑම් 8435 ක තොගයක් හා බිත්තර නිෂ්පාදනයෙන් රු. 127,579 ක ආදායමක් අහිමි වී තිබුණි. | සහල් තොග ස්ටාර්ට් අප් වැලේනජ් වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද සාර භූමි ප්‍රදර්ශනයේදී අලෙවි කිරීම සඳහා කටයුතු කරන ලදී. ඉතිරි සහල් කොරෝනා වසංගතයට ලක් වූ යෞවන සමාජ තරුණ තරුණියන්ගේ පවුල් සඳහා බෙදා දීමටත් තරුණ සේවා සභාවේ කොවිඩ් රෝගය වැලදුණු කාර්ය මණ්ඩලය වෙතත් බෙදා දීමටත් කටයුතු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සභාව විසින් සිස්කෝ පරිගණක පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමට සැලසුම් කර සිස්කෝ ජාත්‍යන්තර සමාගම හා සභාව අතර 2020 දෙසැම්බර් 04 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඒ සඳහා 2021 ජූලි 15 දින රු. 15,708,173 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණ ද එම උපකරණ 2021 ඔක්තෝබර් 29 දින තෙක් නිෂ්කාර්යව ගොඩගසා තිබුණි. කෙසේ වුවද, විධිමත් ක්‍රමවේදයකින් තොරව නිලධාරීන් 10 දෙනෙකු අළුතින් බඳවාගෙන ඒ සඳහා 2021 ඔක්තෝබර් වන විට රු. 4,174,874 ක් පමණ සමස්ථ වියදමක් දරා සභාව මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පරිගණක පාසල සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යටතේ පිහිටුවීමට කටයුතු කර තිබුණි. | සිස්කෝ ආයතනය මගින් පරිගණක උපදේශකවරුන්ට ලබා දෙන ප්‍රායෝගික පුහුණුව 2020 හා 2021 වර්ෂයේදී ලබා දීමට සැලසුම් කර තිබුණු නමුත් රට තුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙම පාඨමාලා ආරම්භ කිරීම සඳහා සුදුසු යටිතල පහසුකම් ස්ථාපනය කිරීමෙන් පසු උපකරණ ස්ථාන ගත කිරීම සඳහා පියවර ගැනීමට අපේක්ෂිතය. | පාඨමාලා ආරම්භ කිරීම සඳහා සුදුසු යටිතල පහසුකම් ස්ථාපිත කිරීමෙන් පසු ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු අතර සැලසුම් කළ පරිදි අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ ආරම්භ කර තිබුණු එරමිණියාය ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් 2021 ඔක්තෝබර් 10 වන දින දක්වාම නිම කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම ඉදිකිරීම සඳහා එකතුව රු. 4,563,066 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකුට ගෙවීම් කර තිබුණිද එම ද්‍රව්‍ය වලින් සියයට 54 ක් හෙවත් එකතුව රු. 2,459,188 ක් වටිනා ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියට ලැබුණු බවට ව්‍යාජ ලේඛන සකස් කර නිලධාරීන් විසින් අයථා පරිහරණය කර තිබුණි. මේ සම්බන්ධව වන අලාභය 2022 අප්‍රේල් දක්වාම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හට විනයානුකූලව කටයුතු කිරීම සඳහා මූලික විමර්ෂණයක් මේ වන විට ආරම්භ කර කටයුතු සිදු කරමින් පවතී.<br><br>එරමිණියාය පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරී ලෙස කටයුතු කරන ලද නිලධාරියාගේ වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) තරුණ සංවිධාන හා සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක යුත් හෝ යුත් වැඩසටහන සඳහා හා පුහුණු මධ්‍යස්ථාන සඳහා මිලදී ගන්නා ලද එකතුව රු. 10,612,500 ක් වටිනා ඩෙස්ක්ටොප් පරිගණක 83 ක් හා රු. 260,000 ක් වටිනා තන්දූරි උඳුනක් දින 17 සිට මාස 09 දක්වා කාලය තුළ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | අදහස් දක්වා නැත. | භාණ්ඩ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කර ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා තොග උපලේඛනයට අනුව වර්ෂ 22 ක සිට මාස 06 දක්වා ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පවතින රු. 3,653,409 ක් වටිනා තොග ඒකක 25238 ක් පැවතුණි. | නිෂ්ක්‍රීයව පවතින මෙම භාණ්ඩ පිළිබඳව සොයා බැලීම් කර අවශ්‍යතාවය මත ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ නිකුත් කිරීම සඳහා පියවර ගැනේ. | භාණ්ඩ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුකර මිලදී ගැනීම සිදුකළ යුතු අතර අවශ්‍යතාවය මත ප්‍රයෝජනයට ගතහැකි භාණ්ඩ නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද “බී හැපි විත් යූත්” වැඩසටහන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමකින් තොරව ට්‍රක් රථයක සවි කරන ලද වීඩියෝ වොල්එකක් කුලී පදනම මත ලබාගැනීම වෙනුවෙන් 2021 ඔක්තෝබර් 07 දින දක්වා දිනකට රු. 60,500 ක් බැගින් දින 14 ක් වෙනුවෙන් රු. 847,000 ක් ගෙවා තිබුණි. | “බී හැපි විත් යූත්” වැඩසටහනට අදාලව වීඩියෝ වොල් සහිත ට්‍රක් රථයක් ලබා ගැනීමේදී ඊට අදාලව පෙර ලියාපදිංචි කරගත් සැපයුම්කරුවන් නොමැති වීම හා කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝ ආයතන විවෘතව නොතිබීම මත විවෘත මිල ගණන් කැඳවීමක් සිදු නොකරන ලදී. ඒ අනුව කමිටුවක් මඟින් මිල ගණන් ලබා ගැනීමෙන් අනතුරුව තාක්ෂණික කමිටු නිර්දේශ සහිතව ප්‍රසම්පාදන කාර්යය ඉටු කර ඇත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ආ) ජාතික තරුණ සේවා සභාව විසින් නිසි සැලසුමකින් තොරව 2021 දෙසැම්බර් මස රු. ලක්ෂ 240 කට අධික වටිනාකමකින් යුත් මිලදී ගන්නා ලද භාණ්ඩ රාශියක් වර්ෂයකට ආසන්න කාලයක් හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණි. එම භාණ්ඩ තුළ වගකීම් කාලය සම්පූර්ණයෙන්ම ඉකුත් වූ එකතුව රු. 1,720,377 ක් වූ Sony Hi Fi System 23 ක් හා මුළු වගකීම් කාලයෙන් අඩක් ඉකුත් වූ එකතුව රු. 3,454,922 ක් වූ රූපවාහිනී හා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 46 ක් හා රු. ලක්ෂ 120 ක් වටිනා කිලෝ ග්‍රෑම් 25 ක රෙදි සෝදන යන්ත්‍ර හා රෙදි වියලන යන්ත්‍ර 03 බැගින් මිලදී ගෙන තිබූ අතර, එම යන්ත්‍ර භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන මෙම උපකරණ ගත්තද උත්සන්න වූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රටෙහි පැවති තත්ත්වය මත අපේක්ෂා කල පරිදි මෙම උපකරණ නිකුත් කිරීමට නොහැකි වූයෙන් මෙම උපකරණ 2022.04.22 වන දින ක්ෂේත්‍රය වෙත නිකුත් කර අවසන් කර ඇත. | භාණ්ඩ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුකර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කළමනාකරණය දැඩි ලෙස අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පෞද්ගලික සමාගමට ලබාදී තිබූ රු. 3,045,700 ක් වටිනා මුද්‍රණ ඇනවුම් 08 ක් සමාගම විසින් බාහිර ආයතන මඟින් ඉටුකරවාගෙන සියයට 10 සිට සියයට 108 දක්වා වූ ලාභ ආන්තිකයක් තබාගෙන තරුණ සේවා සභාවට | අදහස් දක්වා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |

එකතුව රු. 3,886,370 ක වටිනාකමකට ලබාදී තිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයකින් තොරව 2021 පෙබරවාරි මස සිට නුපුහුණු ලිපිකරුවන් ලෙස නිලධාරීන් 11 දෙනෙකු බඳවාගෙන ඔවුන්ට දිනකට රු. 1,800 බැගින් 2021 අප්‍රේල් මස දක්වා එකතුව රු. 488,700 ක් ගෙවා තිබුණි. | සභාවේ පුරප්පාඩුව පවතින තනතුරු වල සේවා අවශ්‍යතාවය මත මෙය සිදුකර ඇති අතර ඉදිරියේදි අභ්‍යන්තර උසස් වීම් සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරිමට අපේක්ෂිතයි. | බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |